**නිකවැරටිය ප්‍රාදේශීය සභාව - 2023**

**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්**,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශිය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින 2020 සහ 2021 වර්ෂවල ඉටු නොකළ ව්‍යාපෘති 24කට අදාළ ව්‍යාපෘති ණය හිමියන් පිළිවෙලින් රු.40,364,473 ක් සහ රු.172,600 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | එකතු වටිනාකම රු.129,950 ක් වූ වර්ග 02 ක් විදුලි බඩු ගබඩා වටිනාකම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | පුස්තකාල පොත් වටිනාකම රු.3,749 ක් පාරිභෝගික ද්‍රව්‍ය තොගයේ වටිනාකම රු.145,000 ක් සහ ලිපි ද්‍රව්‍ය අයිතම 04 ක වටිනාකම රු. 45,900 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | 2023 වර්ෂය තුළ ස්ථාවර වත්කම් මිල දී ගැනීම් රු.273,800 ක් ස්ථාවර වත්කම් මිල දී ගැනීම් ලෙස දක්වා නොතිබුන අතර එකතු වටිනාකම රු.9,612,632 ක් වූ සමාලෝචිත වර්ෂයේ ඉදිකිරීම් සඳහා වැය දැරීම් ප්‍රාග්ධනිත කර ද නොතිබුණි. | -එම- | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විභාග වෙමින් පැවති නඩු කටයුතු 09 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වලින් ඉදිරියේ දී හෙළිදරව් කිරීමට කටයුතු කරන බව | මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අතැති ගබඩා ද්‍රව්‍ය රු.8,690,752 ක ශේෂය තහවුරු කර ගැනීම සඳහා විධිමත් ලේඛන ඉදිරිපත් නොවීම හේතුවෙන් සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | ණයහිමි ශේෂ විධිමත් පරිදි කඩිනමින් නිරවුල් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | 134 වගන්තිය | සභාව විසින් සංවර්ධනය කර සේවා සපයන ප්‍රදේශ දියුණු කළ ගම් ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 371 | අළුත්වැඩියා කටයුත්තක් සඳහා 2023 මාර්තු මාසයේදී ලබා දුන් අත්තිකාරම් රු.26,000 මුදලක් 2023 දෙසැම්බර් 31 දක්වා ම නොපියවා පැවතුණි. | -එම- | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 570 හා 571 | ඉකුත් වටිනාකම රු.1,334,032 ක කල් ඉකුත්වූ තැන්පත් 116 ක් රෙගුලාසි ප්‍රකාරව නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති | | | |
| (i) | 33 රීතිය | වරිපනම් බදු ගෙවීම පැහැර හරින පුද්ගලයන් පිළිබඳ ලැයිස්තුවක් සහ දේපල තහනම් කිරීමේ වරෙන්තුවක් එක් එක් කාර්තුව අවසානයෙහි දී වරිපනම් බදු ලිපිකරු විසින් පිළියෙල කර සභාපතිවරයාගේ අත්සන සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | රීතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 61 රීතිය | වාර්ෂික සමීක්ෂණයක් සිදුකර ලබා ගන්නා ලැයිස්තුවේ ඇතුළත් සියලුම කර්මාන්ත, කර්මාන්ත බදු පිළිබඳ ලේඛනයේ ඇතුළත් කළ යුතු වුවත්, බදු ගෙවන ව්‍යාපාර පමණක් ලේඛනයේ ඇතුළත් කිරීමට කටයුතු කර තිබුණි. බදු නොගෙවන කර්මාන්ත පිළිබඳව ලේඛනවල ඇතුළත් නොවූ අතර ඒ සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | -එම- | -එම- |
| (iii) | 218 රීතිය | පත් කළ මණ්ඩලයක් විසින් වාර්ෂික ඉඩම් ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකළ යුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| (i) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය අංශය තුළ මානව සම්පත් සංවර්ධනය කිරීම සඳහා වූ චක්‍රලේඛය | චක්‍රලේඛයේ 3,4,6.1,6.3,6.5 වගන්තිවල ඇතුළත් විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. | -එම- | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | වාහන/ යන්ත්‍රෝපකරණ හා යතුරුපැදි සඳහා ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | -එම- | -එම- |
| (ඉ) | පළාත් පාලන චක්‍රලේඛ | | | |
| (i) | අංක 2010/02 හා 2010/07/30 දිනැති චක්‍රලේඛයේ 1.2. ii. වගන්තිය | විෂය මාරු ක්‍රමයක් හා එසේ සිදු කිරීම අපහසු නිලධාරින් සඳහා වසර 02 කට වරක් කොට්ඨාස මාරු ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | -එම- | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | අංක 03/2015 හා 2015/11/02 දිනැති චක්‍රලේඛය | වීදි පහන් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි. | -එම- | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,981,285 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.39,728,102 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 වර්ෂය | | | | 2022 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගතආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල්කළ ආදායමෙන්) | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල්කළ ආදායමෙන්) |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 7,524 | 15,664 | 8,833 | 6,830 | 7,120 | 6,351 | 6,299 | 7,338 |
| කුලී | 20,496 | 19,131 | 14,111 | 5,020 | 16,712 | 5,849 | 10,944 | 5,768 |
| බලපත්‍ර ගාස්තු | 1,761 | 1,869 | 1,862 | 7 | 1,676 | 509 | 1,562 | 113 |
| වෙනත් ආදායම් | 188,363 | 91,125 | 33,324 | 57,800 | 37,965 | | 52,158 | 61,034 |
| එකතුව | 218,144 | 127,789 | 58,130 | 69,657 | 473,63 | 12,709 | 70,963 | 74,253 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති අය නොවූ වරිපනම් බදු ශේෂය රු. 6,799,619 ක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | හිඟ ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අය නොවූ අක්කර බදු රු.31,141 ක් පැවතුණි. | -එම- | -එම- |
| (ඇ) | සභා බලප්‍රදේශය තුළ පිහිටි දුරකථන සම්ප්‍රේෂණ කුළුණු වලින් 2023 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | -එම- | ව්‍යාපාර බදු නිසි පරිදි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කුලී රු.4,249,291 ක් හා හිඟ බදු කුලී රු.771,454 ක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | හිඟ ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් බිල් කිරීම් වලින් රු.57,800,660 ක් තවදුරටත් අයවිය යුතුව පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | හිඟ ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඊ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.45,103,250 ක් සහ මුද්දර ගාස්තු රු.12,697,410 ක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | හිඟ ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (උ) | 2023 වර්ෂය තුළ නගර ශාලාව අවස්ථා 18 ක දී බාහිර පාර්ශවයන්ට ලබා දී රු.420,000 ක ආදායමක් උපයා තිබුන ද අවස්ථා 30 කදී ම නගර ශාලාව බාහිර පාර්ශව වෙත නොමිලේ ලබා දී තිබුණි. නගර ශාලාවට අදාළ ජල බිල්පත් , විදුලි බිල්පත් , නඩත්තු වියදම් ද සභාව විසින් දරන හෙයින් නොමිලේ නගර ශාලාව බාහිර පාර්ශවයන්ට ලබා දී තිබීමෙන් සභාව සතු දේපල මඟින් ලබාගත හැකි ආදායමක් අහිමි වී තිබුණු අතර අනවශ්‍ය වියදම් දැරීමක් ද සිදු වී තිබුණි. | -එම- | සභාව සතු දේපල ආදායම් උත්පාදනය සඳහා විධිමත්වයෙදවිය යුතු ය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 85 (අ) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශය ඇතුළත වූ සියලු නිවාස,ගොඩනැගිලි සහ ඉඩම් සඳහා ප්‍රමාණවත් සහ නිසි වැසිකිළි ඉඩ පහසුකම් සපයනු ලැබීම සහතික කිරීමට එළදායී පියවර ගැනීම සභාවේ කාර්යයක් වුව ද, ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමුව නොතිබුණි. සභා බල ප්‍රදේශයේ නිසි වැසිකිළි ඉඩ පහසුකම් නොමැති ගෘහ ඒකක සංඛ්‍යාව 937 ක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් ප්‍රාග්ධන වැය රු.141,726 ක් හා පුනරාවර්තන වැය රු.8,635,852 ක් දරා තිබුණ ද කසළ අලෙවියෙන් ලද ආදායම රු.131,200 ක් වී තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | දිරන හා නොදිරන කසල නිසි පරිදි කළමනාකරණය කිරීමටත් ආදායම් උත්පාදනය කටයුතු වර්ධනය කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවකයින් 14 දෙනෙකුගෙන් රු.519,740 ක අය නොවන සේවක ණය ශේෂයක් පැවතුණි | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | සේවක ණය නිසි පරිදි අයකර ගත යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එකතු වටිනාකම රු.2,460,955 ක වසර 05 කට වඩා පැරණි ගෙවිය යුතු ශේෂයක් නිරවුල් කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | ගෙවිය යුතු ශේෂයන් නිරවුල් කළ යුතුය. |
| (ආ) | වරිපනම් බදු තක්සේරුව වර්ෂ 05කට වරක් තක්සේරු දෙපාර්තමේන්තුව ලවා කරවාගත යුතු වුව ද ප්‍රාදේශීය සභාව විසින් වරිපනම් බදු තක්සේරුව අවසන් වරට සිදුකර තිබුනේ 2017 වර්ෂයේ දී ය. | -එම- | වරිපනම් තක්සේරුව කාලීනව සිදු කළ යුතුය. |
| (ඇ) | සාමාජික අංක සඳහන් නොකිරීම හේතුවෙන් 2023 වර්ෂය තුළ සේවක අර්ථසාධක අරමුදල් ගෙවීමේ දී අවස්ථා 05 ක දී වටිනාකම රු.8,564 ක අධිභාර මුදලක් සේවක අර්ථසාධක අරමුදල්ව ගෙවීමට සිදුව තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | නියමිත පරිදි රාජකාරි ඉටු නොකිරීම නිසා සිදු වූ අනවශ්‍ය වියදමක් බැවින් අදාළ පාර්ශව වලට එරෙහිව කටයුතු කළ යුතුය. |

### 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලී බඩු සවි කිරීම් සහ රථ වාහන යන්ත්‍ර උපකරණ සඳහා ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව පවත්වා ගෙන ගොස් නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | -එම- |

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ආ) | විධිමත් පරිදි සමීක්ෂණයක් සිදුකර සභාව සතු ඉඩම් හා සුසාන භූමි 58 ක භෞතික පැවැත්ම තහවුරු වන පරිදි වැට මායිම් නිසි පරිදි යොදා නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | සියලුම ඉඩම් වත්කම්වල භෞතික පැවැත්ම ආරක්ෂා කළ යුතුය. |
| (ඇ) | සභාව සතු වීදි පහන් අංකනය කර නොතිබූණු අතර පරිගණක ජාලගත කිරීම් ද සිදුකර නොතිබුණි. | එම | වීදි පහන් අංකනය කර පරිගණක ජාලගත කිරීම සිදුකළ යුතුය. |
| (ඈ) | සභාව විසින් නඩත්තු කරන සුසාන භූමි 161 ක් අතුරින් 159 ක සහ ඉඩම් 15 ක අයිතිය සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | මෙම වත්කම්වල අයිතිය පවරා ගත යුතුය. |
| (ඉ) | 2023 වර්ෂයේ තක්සේරු වටිනාකම රු.19,000,000 ක් වූ මෝටර් ග්‍රේඩර් රථය සභාවට පවරාගෙන නොතිබුණි. | -එම- | -එම- |

**3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ,පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොටවෙහෙර කොන්ක්‍රීට් නිෂ්පාදන මධ්‍යස්ථානයේ ස්ථාපිත කර තිබූ ආරක්ෂිත කැමරා පද්ධතිය 2022 ජුනි මස සිට අක්‍රීය තත්ත්වයේ පැවතුණි. | අදහස් ඉදිරිපත් කර නොමැත. | නිෂ්ක්‍රීය වත්කම් ක්‍රියාකාරී තත්ත්වයට පත් කළ යුතුය. |
| (ආ) | කොන්ක්‍රීට් නිෂ්පාදන මධ්‍යස්ථාන පරිශ්‍රය තුළ සභාවට අයිති ජල බවුසරයක් දිරාපත් වෙමින් පැවතුණි. | -එම- | -එම- |
| (ඇ) | සභාව සතු නළ ළිං 258 න් 58 ක් සහ පොදු ළිං 100 න් 20 ක් ක්‍රියාකාරී මට්ටමේ නොපැවතුණි. | -එම- | -එම- |

**3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයවැයගත නොකළ කර්මාන්ත 04 ක එකතු වටිනාකම රු.3,471,624 ක් වැය දරා සමාලෝචිත වර්ෂය තුළ නිමකර තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | කඩිනමින් නිම කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආදායම් විෂයයන් 04 ක ඇස්තමේන්තුගත හා සත්‍ය ආදායම් අතර සියයට 59 ක සිට 725 ක් දක්වා විචලනයන් පැවති අතර වියදම් විෂයයන් 06 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර සියයට 20 කට වඩා වැඩි විචලනයන් පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | ආදායම් ඇස්තමේන්තු හැකිතාක් තාර්කිකව පිළියෙල කළ යුතුය. |

### 4.2 තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු 05 ක් යටතේ හඳුනා ගෙන තිබූ අරමුණු ළඟා කර ගැනීමට රු.458,091 ක් වැය දරා සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟා කර ගත යුතුය. |